# ජල බවුසර් සේවාව ලබා දීම

බල ප්‍රදේශයේ පුරවැසියන්ගේ පානීය හෝ වෙනත් අවශ්‍යතා සඳහා බවුසර් මගින් ජලය සැපයීම පළාත් පාලන ආයතනය විසින් සිදු කරනවා. එම සේවාව ලබා ගන්නේ කෙසේ ද?

- වෙන් කර ගැනීමට ඉඩකඩ සහිත දින සහ වේලාවල් දැන ගැනීමට සභාවේ වෙබ් අඩවියේ හෝ පෙරටු කාර්යාලයේ ඇති ශාලාවේ පොරොත්තු ලේඛනය පරීක්ෂා කර බලා ඉල්ලුම් පත්‍රය පෙරටු කාර්යාලයට බාර දෙන්න

- ඉල්ලුම් පත්‍රය බාර ගෙන බවුසර් ගාස්තුව සහ ආරක්ෂිත ඇප මුදල පිළිබඳ ව පෙරටු කාර්යාලයෙන් ඔබ දැනුම්වත් කරනවා. අදාළ ගාස්තු ගෙවා ලදුපත, ඔබගේ පසු විපරම් අංකය හා ජල බවුසර් රියදුරාට නිකුත් කරනු ලබන ලිපියේ ඔබගෙ පිටපත ලබා ගන්න

- නියමිත දිනයේ දී රියදුරා විසින් ඔබට සේවාව සපයනු ලබන අතර, ඒ බවට ඔබගෙන් තහවුරු කර ගැනීම ලිඛිත ව ඉල්ලා සිටිනු ඇත. ඒ ලිඛිත තහවුරු කිරීම කරන්න

- කාර්යය නිම කළ බව හෝ නොහැකි වූ බව රියදුරා පෙරටු කාර්යාලයට ඒ අවස්ථාවේ දී ම වාර්තා කරනු ඇත.

- රියදුරාගේ වාර්තාවට අනුව, නිම කළ කාර්ය ප්‍රමාණයට සරිලන ගාස්තුව සහ ආපසු ගෙවිය යුතු යම් මුදලක් වේ නම්, විෂය භාර නිලධාරී විසින් ඔබට දැනුම් දෙනු ඇත.



## සේවාව සැපයීමට නොහැකි වූ විට ... ... ?

- සේවාව සැපයීමට නොහැකි වූ බවට රියදුරා විසින් ඒ අවස්ථාවේ දී ම කරන දැනුම් දීමට අනුව, පෙරටු කාර්යාලය විසින් ඒ බව විෂය භාර නිලධාරීට වාර්තා කරනවා.

- විෂය භාර නිලධාරීට වාර්තාව ලැබුණු විහාම, ඉල්ලුම්කරුට ආපසු ගෙවිය යුතු මුදල ගණන් බලා ඉංජිනේරුගේ / ලේකම්ගේ අනුමතය ඇතිව ඒ මුදල චෙක්පතක් මගින් ඔබට ගෙවීමට සලස්වනු ලබනවා.